# 7.1.1 ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු



The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු කොටස් කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකි ය.

- දේශපාලන හේතු

## රාජාණ්ඩු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ දූෂිත පාලනය

විප්ලවයට පෙර ප්‍රංශයේ පැවතියේ රාජාණ්ඩු පාලන ක්‍රමයකි. මේ කාල වකවානුව වන විට ප්‍රංශය පාලනය කළේ බූර්බෝන් රාජවංශය විසිනි. XIV වන ලුවී හා XVI වන ලුවී එම රාජ වංශයේ පාලකයන් දෙදෙනෙකි. එරට රජවරු තමන්ට එම පදවිය දේව වරමින් ලැබුණු එකක් සේ සලකා කටයුතු කළහ. රජු වටා ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල කේන්ද්‍රගත වී තිබුණි. අසීමිත බලතල භුක්ති විඳින ලද XIV වන ලුවී රජු විසින්

* “ රාජ්‍යය නම් මමයි ” යනුවෙන් කරන ලද ප්‍රකාශය ද,

* “ මා අපේක්ෂා කරන ඕනෑම දෙයක් නීත්‍යනුකූල ” යනුවෙන් කරන ලද ප්‍රකාශය තුළින් ද ඔහු භුක්ති විඳි අසීමිත බලය පිළිබඳව අවබෝධ කර ගත හැකි වේ. 1715 දී ඔහුගේ මරණයෙන් පසු වයස අවුරුදු පහේ දී බලයට පත් වූ XV වන ලුවීට ( XIV වන ලුවීගේ මුනුපුරා ) ප්‍රංශය කාර්යක්ෂම ලෙස පාලනය කිරීමට නොහැකි විය.එම රජුගේ කාලයේ දී විදේශීය යුද්ධ ගණනාවකට සම්බන්ධ වූ ප්‍රංශය ඉතා අවුල් සහගත තත්වයකට පත් විය. දුප්පත් ගොවීන් මත පැටවෙන ආර්ථික බදු බර ගැන නොතකා ඕස්ට්‍රියාවේ රජ කිරුළේ හිමිකම පිළිබඳව එංගලන්තය සමග පැවති යුද්ධය සත් අවුරුදු යුද්ධය යනුවෙන් හැඳින්වේ. මේ සඳහා ප්‍රංශයට විශාල මුදලක් වැය කිරීමට සිදු වූ අතර ප්‍රංශය සතු වූ යටත් විජිත අධිරාජ්‍යය ද සම්පූර්ණයෙන් ම අහිමි විය. බදු ගෙවා ගත නොහැකි වූ දුප්පත් ගොවීන් බන්ධනාගාර ගත කෙරුණි. රටේ පාලන කටයුතු පිළිබඳ XV ලුවී රජු උනන්දුවක් නොදැක්වූ අතර ලෞකික සැප සම්පත් භුක්ති විඳිමින් ඉතා සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන ලදි. රජුගේ ඇමතිවරු වැදගත් ප්‍රශ්න පිළිබඳව රජු සමග සාකච්ඡා කිරීමට උත්සාහ කළ අවස්ථාවල දී “ මගෙන් පසුව කල්පාන්තය යි” කියමින් රජු ඒවාට සහභාගී නොවුණි. ඔහු විසින් රටේ වැදගත් තනතුරුවලට ඔහුගේ හිතවතුන් පත් කරගන්නා ලදි. විදේශ යුද්ධවලින් ප්‍රංශ භාණ්ඩාගාරය හිස් වූ නමුත් රජු ඒ ගැන කිසිදු සැලකිල්ලක් නොදැක්වී ය. කථා කිරීමේ නිදහස සහ ප්‍රකාශන නිදහස සම්පූර්ණයෙන් ම මැඩපැවැත් වූ ඔහු ජනතා ප්‍රශ්න ගැන කිසිදු සැලකිල්ලක් දැක්වූයේ නැත. රජුගේ දේශපාලන හා පෞද්ගලික සතුරන් මැඩීම සඳහා බැස්ටීල් බන්ධනාගාරය යොදා ගන්නා ලදි. මේ නිසා ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ දූෂිත පාලනයේ සංකේතයක් බඳු වූ බැස්ටීල් හිර කඳවුරට ප්‍රංශ විප්ලවයේ මුල් ම ප්‍රහාරයේ එල්ල විය.



← බැස්ටීල් හිර කඳවුර.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ii රජුගේ අධිසුඛෝපභෝගී ජීවිතය

15 වන ලුවී රජුගේ අනුප්‍රාප්තිකයා වූයේ 16 වන ලුවී රජතුමා ය. ඔහු ඉතා ඥානාන්විත සහ යහපත් අභිප්‍රායන්ගෙන් යුත් රජෙක් වුවත් ප්‍රංශයේ ඇතිවෙමින් තිබූ පරිහානිය වළක්වාලීම සඳහා කළ යුතුව තිබූ බලවත් ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය එඩිතර ආත්ම ශක්තිය ඔහුට නොතිබුණි.

එමෙන් ම මෙම රජවරු ගත කළ අධිසුඛෝපභෝගී ජීවිත ජනතා අප්‍රසාදයට බඳුන් විය. රජු වාසය කළ වර්සේල්ස් මාලිගය අක්කර ගණනක් පුරා විහිදුන විශාල එකකි. එය ජලාශ, උද්‍යාන, ජල තටාංග, මල් ගොමු හා අලංකාරයට යෙදූ විවිධ නිර්මාණවලින් සමන්විත විය. රජුගේ මාලිගය රජු ගත කළ අධික සුඛෝපභෝගී ජීවිතයේ කැඩපතක් බඳු විය.



වර්සේල්ස් මාලිගයේ ඉදිරිපස ගේට්ටුව.

වර්සේල්ස් මාලිගයේ උද්‍යානය.





සම්පූර්ණ වර්සේල්ස් මාලිගය.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

මාලිගයේ ඇතුළත හා නිදන කාමර.







## iii 16 වන ලුවී රජුගේ අදූරදර්ශී ක්‍රියා කලාපය



16 වන ලුවී රජු



Copyright © www.e-thaksalawa.moe.gov.lk

උදා :- දක්ෂ ඇමතිවරුන් ඉවත් කර රදළයන්ගේ ඉල්ලීම පරිදි අදක්ෂ ඇමතිවරු පත්කිරීම.

දහතුන් වන ලුවී රජුගේ පාලන සමයේ සිට බූර්බොන් වංශයේ රජවරු ස්ටේට්ස් ජෙනරල් සභාවේ උපදෙස් පැතීම අතහැර දමා තිබුණි. එම මණ්ඩලයේ උපදෙස් පැතීමෙන් රජුට කිසිදු ප්‍රයෝජනයක් සිදු නොවන බව ඔවුන්ගේ අදහස විය. ස්ටේට්ස් ජෙනරල් සභාව නොමැති තැන සියලු බලතල රජු වෙත පවරා ගෙන තිබූ නමුත් රාජ්‍ය පාලන කටයුතුවල දී ඔහුට කාඩිනල්, රිච්ලියු, මැසරින් වැනි දක්ෂ මහ ඇමතිවරුන්ගේ ද කෝල්බෙයා වැනි මුදල් ඇමතිවරුන්ගේ ද උපදෙස් ලැබුණි. එහෙත් 18 වන සියවස අවසාන වන විට රටේ ඉරණම සම්බන්ධයෙන් ප්‍රංශ රාජාණ්ඩුවට මග පෙන්වීම සඳහා එවැනි දක්ෂ ඇමතිවරුන් නොවී ය.

එමෙන් ම මේ වකවානුව වන විට ඇමරිකාවේ ජනපද වාසීන් මව් රාජ්‍යයේ ( බ්‍රිතාන්‍යයේ ) පීඩිත පාලනයට එරෙහිව කරන ලද සරටෝගා සටනේ දී විශිෂ්ට ජයග්‍රහණයක් ලැබීමත් සමග ඔවුන්ට යුද්ධය සඳහා අවශ්‍ය යුධ උපකරණ, සොල්දාදුවන් සහ මූල්‍ය සම්පත් යන සෑම අංශයකින් ම ආධාර කිරීමට ප්‍රංශ රාජාණ්ඩුව තීරණය කරන ලදි. එමගින් ප්‍රංශයේ මූල්‍යමය තත්ත්වය බෙහෙවින් පිරිහුණි. මේ නිසා 16 වන ලුවී රජු තමා මුහුණ පා සිටින ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යෝජනා කිරීම පිණිස දක්ෂ පුද්ගලයෙකු වූ ටර්ගෝ මුදල් ඇමති තනතුරට පත් කිරීමට පියවර ගන්නා ලදි. ටර්ගෝ ඇමතිවරයාගේ ප්‍රධානතම උපදේශය වූයේ වරප්‍රසාද ලත් පන්තියේ අයගෙන් බදු අය කළ යුතු බවයි. එහෙත් එම උපදේශය ක්‍රියාත්මක කරනු වෙනුවට රජු පියවර ගත්තේ සිය බිසවගේ උපදෙස් පරිදි දක්ෂ ඇමතිවරයෙකු වූ ටර්ගෝ සේවයෙන් පහ කිරීමයි.

## iv මාරි ඇන්ටොයිනට් බිසවගේ උපදෙස් පරිදි කටයුතු කිරීම



මාරි ඇන්ටොයිනට් ජොසපියා ජීන් ඩීන් ලෝරේන් I ෆ්‍රැන්සිස්ගේ හා මාරියා තෙරේසාගේ දියණිය වූවා ය. ඔස්ට්‍රියානු කාන්තාවක වූ ඇය ප්‍රංශ ඔස්ට්‍රියානු මිත්‍ර ගිවිසුමේ ජීවමාන සාක්ෂියක් බඳු විය. ඇය ප්‍රංශයට පැමිණියේ ප්‍රංශ කිරීටය හිමි කුමරාගේ භාර්යාව වශයෙනි.

ඉතා කෙළිලොල් විනෝදයට බර කාන්තාවක වූ ඇය විවිධ ඇඳුම් පැළඳුම් මෝස්තර අනුගමනය කළා ය. ඇය පැළඳි විශාල ශීර්ෂාභරණය හිසට වඩා බොහෝ උසින් වැඩි විය. දැඩි සුඛෝපභෝගී දිවියක් ගත කළ ද ප්‍රංශ රාජ සභාවේ වෙහෙස කර චාරිත්‍ර නීති මාලාවට එරෙහිව ඇය කටයුතු කළා ය. ඉතා අහංකාර ස්ත්‍රියක වූ ඇය රජු සතු වූ අධික බලය සහ රජතුමාගේ දුර්වලකම් ප්‍රයෝජනයට ගෙන රාජ්‍ය පාලනයට සෘජුව ම ඇඟිලි ගැසුවා ය. රාජ සභාවේ සිටි දක්ෂ ඇමතිවරු බලයෙන් පහ කිරීමට රජුට බලපෑම් කිරීමට පවා ඇය එඩිතර වූවා ය. ඇය රාජ්‍ය පාලනය කටයුතුවලට ඇඟිලි ගැසීම සහ සාමාන්‍ය ජනතාව නොසලකා හැරීම කෙරෙහි ජනතාව තුළ පැවතියේ දැඩි අප්‍රසාදයකි.

## V. රාජාණ්ඩුව දුර්වල වීම

බූර්බෝන් රාජ වංශයේ 14 වන ලුවී රජුගේ පාලන කාලයේ දී ක්‍රියාත්මකව පැවති අසහාය රාජාණ්ඩු බලය 1715 ඔහුගේ මරණයත් සමග අවසාන විය. වයස අවුරුදු පහේ දී රජකමට පත් වූ 15 වන ලුවී රජුට ( 14 වන ලුවීගේ මුණුබුරා ) ප්‍රංශය කාර්යක්ෂමව පාලනය කිරීමේ හැකියාව හෝ අවබෝධය නොවී ය. එම රජුගේ කාලයේ දී විදේශීය යුද්ධ ගණනාවකට මුහුණ දුන් ප්‍රංශය දිනෙන් දින අවුල් සහගත තත්ත්වයකට පත් විය.

උදා :- සත් අවුරුදු යුද්ධය

රටේ පාලන කටයුතු පිළිබඳව රජු තුළ එතරම් තැකීමක් නොතිබුණි. විදේශ යුද්ධවලට විශාල වියදමක් දැරීමට සිදු වූ නිසා ප්‍රංශ භාණ්ඩාගාරය හිස් වුව ද රජුට ඒ පිළිබඳව කිසිම හැඟීමක් නොතිබුණි.

ඔහුගෙන් පසු බලයට පත් වූ 16 වන ලුවී රජු යහපත් කරුණාවන්ත අයෙක් වුවද රට තුළ බරපතල ප්‍රතිසංස්කරණ කිරීම සඳහා අවශ්‍ය එඩිතර ආත්ම ශක්තිය ඔහුට නොවී ය. මේ වන විට යුද්ධ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීමත්, රාජ්‍ය ධනය හරි හැටි පාලනය නොකිරීමත් නිසා ආණ්ඩුව විශාල පිරිහීමකට ලක් වී තිබුණි. එමෙන් ම රාජ සභාවේ ඇමතිවරුන්ගේ අතිශයෝක්ති වර්ණනා සහ මාරි ඇන්ටෝයිනට් බිසවගේ අවශ්‍යතා සහ උපදෙස්වලට අනුව සකස් වූ ඔහුගේ තීරණවලින් ප්‍රංශයට කිසිදු යහපතක් සිදු නොවී ය.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ හේතු.

විප්ලව සමය වන විට ප්‍රංශයේ පැවතියේ වැඩවසම් සමාජ ක්‍රමයකි. වැඩවසම් ක්‍රමය යටතේ විශාල වශයෙන් ඉඩම් අයිති කරගෙන සිටි රදලවරුන්ගේ සහභාගීත්වයෙන් රාජාණ්ඩුව පාලන ක්‍රමයක් පවත්වා ගෙන යනු ලැබී ය. මේ කාල වකවානුව වන විට ප්‍රංශ ජන සමාජය තුළ දක්නට ලැබුණු ලක්ෂණ කිහිපයකි.

### i පන්ති සහිත සමාජයක් බිහි වීම.

මෙම කාලය වන විට ඉතාමත් ද්වේශ සහගත විෂමතා සහ අසාධරණ වරප්‍රසාද ප්‍රංශ සමාජයේ කැපීපෙණුණ ලක්ෂණය විය. සමාජය ඉතා පැහැදිලි ලෙස ප්‍රජා ගණ හෙවත් පන්ති තුනකට බෙදී පැවතුණි.

*** පළමුවන ප්‍රජා ගණය ( පල්ලිය)**

ප්‍රංශ පල්ලිය පාලනය කළ ආච් බිෂොප්, බිෂොප් සහ ඇබට්වරුන් ආදී ප්‍රධාන පෙළේ පුජකවරුන්ගෙන් මෙම කොටස සමන්විත වේ.

ප්‍රංශයේ වගා කළ ඉඩම්වලින් 1/5 ක කොටසක් පල්ලියට අයිතිව පැවති අතර ආණ්ඩුව කෙරෙහි ඉමහත් සේ බලපෑම් කිරීමේ හැකියාව ද එයට තිබිණි. පල්ලියට අයත් ප්‍රධාන පෙළේ පූජකවරුන් බදු ගෙවීමෙන් නිදහස් වූ අතර වංශාධිපතිවරු සමඟ එකතුව ඔවුහු අසහාය රාජාණ්ඩුවට සහය දැක්වූහ. පල්ලිය ජනතාවට ප්‍රජා සේවය සැපයීම වෙනුවෙන් " තීද් " නමින් බද්දක් අය කළහ. ඉගැන්වීම් කටයුතු සහ අධ්‍යාපනික මධ්‍යස්ථාන පවත්වා ගැනීම ද කළ පහළ තලයේ සිටි පූජකවරු ඉතා දුක්ඛිත ජීවිත ගත කළහ.

*** දෙවන ප්‍රජා ගණය. ( වංශාධිපතිවරු )**

වංශාධිපති පන්තිය හෙවත් දෙවන ප්‍රජා ගණයට අයත් පවුල් 80,000 ක් පමණ ප්‍රංශයේ තිබුණි. රිචලියුගේ පාලන සමයේ දී ප්‍රංශයේ වැඩවසම් ක්‍රමය පරිහාණියට පත් වූ නමුත් ඉහත කී වංශාධිපති පවුල් බොහෝ බදු වර්ග නොගෙවා සිටීම, ප්‍රංශ පරිපාලනයේ ඉහළ තනතුරුවලට පත් වීම සහ ගොවීන්ගෙන් අය කළ විවිධ වැඩවසම් දීමනා මගින් විශාල ආදායමක් සපයා ගැනීම වැනි වරප්‍රසාද භුක්ති වින්දහ. මෙම වංශාධිපතිවරු බොහෝ දෙනා සිය ප්‍රවේණිය තුළ ජීවත් නොවිණි. වංශාධිපතිවරුන්ගේ සුඛෝපභෝගී ජීවිත සඳහා තමන් නිකරුණේ බදු ගෙවන බවට හැඟීමක් ගොවි ජනතාව තුළ වර්ධනය වෙමින් පැවතුණි.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

*** තුන්වන ප්‍රජා ගණය ( පොදු මහජනතාව )**

ප්‍රංශ ජනගහනයෙන් විශාලතම කොටස තුන් වන ප්‍රජා ගණයට අයත් විය. ඒ අතර මධ්‍යම පාන්තිකයෝ,ගොවීහු සහ ශිල්පීහු වූහ. උගත් මධ්‍යම පංතිය, වෙළෙඳුන්, නීතිඥයන්, ගුරුවරුන් සහ වෛද්‍යවරුන් වැනි අයගෙන් සමන්විත විය. ප්‍රංශ සමාජයේ පැවති විෂමතා සහ ඒකාධිපති රාජාණ්ඩුව විසින් අය කරන ලද අසාධාරණ බදු වර්ග පිළිබඳව ඔවුන්ට මනා අවබෝධයක් තිබුණි. මෙම ප්‍රජා ගණයට අයත් ජනතාවගේ ශුභ සාධනය කෙරෙහි ආණ්ඩුව කිසිදු සැලකිල්ලක් නොදැක්වූ අතර ප්‍රංශ විප්ලවය ආරම්භ කිරීමෙහි ලා ප්‍රධානතම බලවේගය වූයේ මෙම කණ්ඩායම යි.

තමන් අන්ත අසරණ දිළිඳු තත්ත්වයකට ඇද දැමීමට වග කිව යුතු අය පිළිබඳව ගොවි ජනතාව පැමිණිලි කළහ. ඉඩම් හිමියා , පල්ලිය හා රජය යන සියලු අයට බදු ගෙවීමෙන් පසු සිය ආදායමෙන් ඉතිරි වූයේ 18% ක් පමණ අඩු ප්‍රමාණයක් බවත් එයින් සිය ජීවිත පවත්වා ගැනීම ඉතා අසීරු බවත් ඔවුන් පාලකයන්ට දැනුම් දෙන ලදි. සතුන් දඩයමේ ගිය වංශාධිපතියන් මෙම ගොවීන්ගේ ගොවිපළවල් පාළු කිරීම ඉවසා දරා සිටීමට සිදුවීම ඔවුන් මුහුණ පෑ තවත් නින්දා සහගත සිද්ධියක් විය. ශිල්ප ශ්‍රේණි මගින් ඒවායේ ස්වාමීන්ට වාසිදායක නීති රීති පැනවීම නිසා සාමාන්‍ය ශිල්පීන්ට ඉතා ස්වල්ප වූ ආදායමක් පමණක් ඉපයිය හැකි වීම ප්‍රංශයේ ශිල්පීන්ගේ පැමිණිල්ල විය.

පොදු මහජනතාව අතර සිටි මධ්‍යම පන්තිය වෙළෙඳාම හා වෙනත් ව්‍යාපාරික කටයුතුවලින් ධනවත් වූ පිරිසකි. එහෙත් ඔවුන්ට දේශපාලනික වශයෙන් වැදගත්කමක් ලැබී නොතිබිණි. නමුත් බ්‍රිතාන්‍ය වැනි රටවල මේ අවධිය වන විට මධ්‍යම පන්තියට දේශපාලන බලතල ලැබී තිබුණි. එහෙත් ප්‍රංශයේ රදලයන් සතු වූ ආධිපතිවාදී බලතල නිසා මධ්‍යම පාන්තිකයෝ කලකිරී සිටියහ. උගත්කමින් ඉහළ මට්ටමක සිටිය ද රජයේ බලතල ඔවුන්ට හිමි නොවූ අතර ඒවා රදලයන්ට සීමා වී පැවතිණි. කෙනෙකුගේ තත්ත්වය මැනිය යුත්තේ උපත අනුව නොව හැකියාව මතය යන අදහස ඇති වූයේ මේ නිසා ය. ප්‍රංශ විප්ලවයේ දී සමානාත්මතාව යන්නෙන් අදහස් කරන ලද්දේ ද මෙය යි.

රටේ රදලයන් අසීමිත වරප්‍රසාද භුක්ති විඳින ලදි. ඒ අතර,

I රටේ ඕනෑම ස්ථානයක දඩයම් කිරීමට ඔවුන්ට අයිතියක් තිබීම.

II රදලයින් සතු ධාන්‍ය ඇඹරුම් හල්, වයින් පෙරන යන්ත්‍ර, පෝරණු ආදියෙන් ගොවීන් සිය අවශ්‍යතා ඉටු කර ගත යුතු වූ අතර රදලයින් විසින් ඒ සඳහා අධික ගාස්තු අය කිරීම.

III ගොවීන්ගේ ඉඩම්වලින් බදු අයකර ගැනීමේ අයිතිය රදලයන් සතු වීම.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු

## i ඒකවිධ නීති පද්ධතියක් නොතිබීම

ප්‍රංශයේ සෑම ප්‍රදේශයක ම සමාන ආකාරයෙන් එක ම නීතිය ක්‍රියාත්මක වීම දක්නට නොලැබුණි. එක් ප්‍රදේශයක සාධාරණ හා යුක්ති සහගත ලෙස සලකනු ලැබූ නීතියක් තවත් ප්‍රදේශයක එසේ පිළිගැනුණේ නැත. රජයේ සියලු ම දෙපාර්තමේන්තුවල දක්නට ලැබුණේ නෑදෑ හිත මිතුරන්ට පක්ෂපාතීකම් දැක්වීම හා වෙනත් විවිධ දූෂණ හේතු කොට ගෙන රජය කෙරෙහි මහජන අප්‍රසාදය වර්ධනය වන තත්ත්වයකි.

මෙම තත්ත්වය ප්‍රංශයේ අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම කෙරෙහි ද, ආර්ථික සංවර්ධනය කෙරෙහි ද විශාල බාධාවක් විය. වෙළෙඳ කටයුතුවල නිරත වූ මධ්‍යම පාන්තිකයන්ට මේ නීති රීති හා බදු නිසා අධික බදු මුදලක් ගෙවීමට සිදු විය.

උදා :- දකුණු ප්‍රංශයේ සිට පැරීසියට වයින් පටවාගෙන ගිය ජල යාත්‍රාවකට ස්ථාන හතළිහක දී බදු ගෙවීමට සිදු වූ අතර ඒ සඳහා වියදමට අමතරව සති දෙකක කාලයක් ගත වූ බව ද වාර්තා වී තිබිණි.

## රාජ්‍ය භාණ්ඩාගාරය බංකොලොත් වීම නිසා මධ්‍යම පාන්තිකයන් ආයෝජනය කළ මුදල් සඳහා සුරක්ෂිත බවක් නොවීම

මෙය මධ්‍යම පන්තියේ දියුණුවට මහත් බාධාවක් විය. මධ්‍යම පන්තියේ අපේක්ෂාව වූයේ නිර්බාධවාදී ආණ්ඩු ක්‍රමයකි. නමුත් මධ්‍යම පාන්තිකයන් අපේක්ෂා කළ ක්‍රියාශීලී පාලනය හෝ ආර්ථික සුරක්ෂිත භාවය ලබා දීමට ප්‍රංශ රාජාණ්ඩුව අපොහොසත් විය. මධ්‍යම පන්තිය විප්ලවයේ නායකත්වය ගැනීමට මෙම කරුණු ඍජුව ම බලපාන ලදී.

## විප්ලව සමය වන විට ප්‍රංශ භාණ්ඩාගාරය සම්පූර්ණයෙන් ම බංකොලොත් වී තිබීම

විප්ලවය ආසන්න වකවානුව වන විට භාණ්ඩාගාරය සම්පූර්ණයෙන් ම බංකොලොත් වී පැවතිණි. ඒ සඳහා ප්‍රධාන කරුණු කිහිපයක් බලපාන ලදී. ඒවා නම්,

I රජුගේ සහ රජ පවුලේ අධිසුඛෝපභෝගී ජීවිතය සඳහා වැය වූ අධික වියදම

II අනවශ්‍ය යුද්ධ වියදම්

උදා :- සත් අවුරුදු යුද්ධය

(දුප්පත් ගොවි ජනතාව මත විශාල බදු බරක් පටවමින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය ගැන නොසලකමින් ඔස්ට්‍රියාවේ රජ කිරුළේ හිමිකම වෙනුවෙන් ගෙන ගිය යුද්ධය සත් අවුරුදු යුද්ධය ලෙස හැඳින්වේ. අවසානයේ දී එම යුද්ධය නිසා ප්‍රංශය සතු වූ යටත් විජිත පවා අහිමි විය).

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

:-III ඇමරිකානු නිදහස් සටනට සහභාගී වීම

ඇමරිකානු ජනපද වාසීන් තම මව් රටේ පාලනයෙන් නිදහස ලබා ගැනීම ( බ්‍රිතාන්‍ය පාලනයෙන් ) සඳහා ගෙන ගිය අරගලය ඇමරිකානු නිදහස් සටන යි. මෙම සටනේ දී ඇමරිකානු ජනපද වාසීන්ට පක්ෂපාතීව බ්‍රිතාන්‍යට විරුද්ධව සටන් කිරීම සඳහා ප්‍රංශය ඉදිරිපත් විය. මේ සඳහා ද ඔවුන් විශාල වශයෙන් තම ධනය වැය කිරීම ප්‍රංශයේ ආර්ථික අර්බුදය උග්‍ර වීමට තව දුරටත් හේතු විය.

- අසාධාරණ බදු ක්‍රමය

ප්‍රංශයේ පැවති අධික බදු බර ප්‍රංශ විප්ලවයට බලපෑ තවත් හේතුවක් විය. ප්‍රංශයේ සාමාන්‍ය වැසියන් තම ආදායමෙන් 60% ක් පමණ බදු වශයෙන් ගෙවිය යුතු විය. ජනතාව පීඩාවට පත් කළ බදු වර්ග රැසක් ප්‍රංශයේ පැවතිණි.

උදා :- ටේල් - සාමාන්‍ය ජනතාවගේ නිවාස හා ඉඩම්වලින් අය කළ බද්දකි. මෙම බදු වර්ගය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය. **ලියෝන්, පැරිස් වැනි රදලයන් වැඩි වශයෙන් වාසය කළ නගර මෙම බද්දෙන් නිදහස් කර තිබුණි.**

ගැබේල් - ලුණුවලින් අය කළ බද්දකි. සෑම වැඩිහිටි අයෙක් ම වසරකට ලුණු රාත්තල් හතක් මිලදී ගත යුතු වීම. ලුණු මිල ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය. මේ නිසා ලුණු අඩු ප්‍රදේශවල සිට ලුණු වැඩි ප්‍රදේශවලට හොරෙන් ලුණු ප්‍රවාහනය කෙරිණි. ලුණු විකිණීම රජයේ ඒකාධිකාරයක් වූ බැවින් හොරෙන් ලුණු ප්‍රවාහනය කළ දහස් ගණන් පිරිස් බන්ධනාගාර ගතකර තිබුණි.

කැපිටේෂන් - සෑම දෙනෙකුගෙන් ම අය කරන බද්දක් ලෙස 1695 දී හඳුන්වා දී තිබුණි. එහෙත් ක්‍රියාත්මක කිරීමේදී එම බදු ද සාමාන්‍ය ජනතාව මත පැටවිණි.

මේ හැරුණු විට ප්‍රංශ ගොවි ජනතාව වැඩි වශයෙන් පීඩාවට පත් වූයේ බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියෙන් මිලට ගත් බදු කරුවන්ගේ හිංසා පීඩාවලට ගොදුරු වීම හා ගෙවිය යුතු බදු පිළිබඳව පැවති අවිනිශ්චිතතාව නිසා ය. වරප්‍රසාද ලැබූ පන්තිය බොහෝ බදු වර්ග ගෙවීමෙන් නිදහස් වූ අතර එම බර නිරායාසයෙන් ම ගොවි ජනතාව මත පැටවී තිබුණි.



xiv වන ලුවී රජු


Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ප්‍රංශ විප්ලවයට බලපෑ බාහිර හේතු

## දාර්ශනිකයන්ගේ බලපෑම

විවිධ අදහස් මගින් ලෝකය පාලනය වන බවත් එම අදහස් ඉදිරිපත් වන්නේ දාර්ශනිකයන්ගෙන් බවත් කියනු ලැබේ. 18 වන සියවස වන විට ප්‍රංශය තුළ එවැනි ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෝ කිප දෙනෙක් බිහිවිය. ඔවුන්ගේ අදහස් ද ප්‍රංශ විප්ලව සමයේ ගොඩනැගෙමින් තිබූ රාජාණ්ඩු විරෝධී හැඟීම් සඳහා අවශ්‍ය කරන පන්නරය සැපයීමට ඉවහල් විය.

එම දාර්ශනිකයන් අතර,

### 01.වෝල්ටෙයාර්

ශ්‍රේෂ්ඨ ලේඛකයෙකු හා විවේචකයෙකු වශයෙන් ලෝක ප්‍රසිද්ධ වූ වෝල්ටෙයාර්ගේ ලිවීමේ ශෛලිය සහ කටුක එහෙත් සිත් කාවදින ලෙස විවේචනය කිරීමේ ශක්තිය අද්විතීය විය. සිය කෘති මගින් පල්ලිය හා රජය වැනි ආයතනවල එකල පැවති දූෂණවලට එරෙහිව දැඩි ලෙස පහර ගැසූ වෝල්ටෙයාර් වංශාධිපතිවරුන්ගේ විකාර හැසිරීම් අපහාසයට ලක් කළේය. 1694 - 1718 අතර කාලයේ ජීවත් වූ වෝල්ටෙයාර්ගේ මෙම ලේඛන ශෛලිය ගැන ලියමින් මැකෝලි කීවේ " මිනිසා විසින් කවදා හෝ උපයෝගී කරගත් බුද්ධිමය ආයුධ වෙතොත් ඒ අතර ඉතාමත් භයානක ම ආයුධය වෝල්ටෙයාර්ගේ සමච්චලය බව යි."



### 02.මොන්ටෙස්කියු



වෝල්ටෙයාර් ප්‍රබුද්ධ ඒකාධිපතිවාදයකට කැමති වූ අතර මොන්ටෙස්කියු ව්‍යවස්ථානුකූල රාජාණ්ඩු පිළිබඳව අධ්‍යයනය කළ අයෙකි. 1659 - 1755 කාලයේ දී එංගලන්තයේ ක්‍රියාත්මක වූ අන්දමේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් ප්‍රංශයේ ද පිහිටුවනු දැකීම මොන්ටෙස්කියුගේ ප්‍රාර්ථනාව විය. ඔහු "නීතියේ සාරය" නම් කෘතිය මගින් සිය අදහස් ඉදිරිපත් කරන ලදි. ඔහු විසින් ඉදිරිපත් කරන ලද බලතල බෙදීමේ න්‍යාය මගින් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ තුනක් මගින් ආණ්ඩුවේ බලය ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කරන ලදි. එක් පුද්ගලයෙකු වටා බලය ඒකරාශි වීමෙන් ඒකාධිපති පාලනයක් ගොඩනැගෙන බවත්, බලතල බෙදීයාම තුළින් දූෂිත රාජාණ්ඩු අහෝසි වීගොස් පුද්ගලයාගේ නිදහස ආරක්ෂා වන බවත් ඔහු ප්‍රකාශ කළේ ය.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

03.ජීන් ජැක් වින් රූසෝ

මෙකල ප්‍රංශයේ බිහි වූ දාර්ශනිකයන් අතර ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකේ. රජු සහ ඔහුගේ යටත් වැසියන් එක්තරා සම්මුතියක පාර්ශ්වකරුවන් බවත්, ඒ නිසා රජු යටත් වැසි ජනතාවගේ කැමැත්තට අනුකූලව පාලනය නොකරන්නේ නම් ඔහුගේ රජකම අහිමි වන බව ද රූසෝ සමාජ සම්මුතිය නම් සිය කෘතිය තුළින් ප්‍රකාශ කරන ලදි. එවැනි වාතාවරණයක් යටතේ රජු නෙරපා හැරීමට ජනතාවට සම්පූර්ණ අයිතිය ඇති බව ද ඔහු දැක්වීය. මෙලෙස රූසෝ මහජන පරමාධිකාරී බලය පිළිබඳ න්‍යාය සනාථ කරමින් ලියූ දෑ ඔහුගේ අනුගාමිකයන් වෙත කෙතරම් ජීවයක් ඇති කළේ ද කිව හොත් ඔවුහු පීඩාකාරී රාජාණ්ඩුවට විරුද්ධව කැරලි ගැසීමට සූදානම් වූහ. ප්‍රංශ විප්ලවය සඳහා ජනතාව ඒ තුළින් නව පන්නරයක් ලැබූහ.



04. ඩිඩෙරොට්



මොහු විසින් නව දැනුම එකතු කොට විශ්වකෝෂයක් සකස් කරන ලදි. ප්‍රංශයේ දූෂිත මෙන් ම අබලන්ව තිබූ පරිපාලන රටාවේ පැවති දුර්වලතා සහ අඩුපාඩු මොහු විසින් පෙන්වා දෙන ලදි. එයට ප්‍රතිකර්ම වශයෙන් ප්‍රංශයට සුදුසු නව ක්‍රියාමාර්ග කිහිපයක් ද ඔහු විසින් යෝජනා කරන ලදි.


Copyright © www.e-thaksalawa.moe.gov.lk